ඌව පළාත් සභාව - 2022

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඌව පළාත් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 29 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 31 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

* මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඌව පළාත් සභාවට එරෙහිව පවරා ඇති නඩු කටයුතු 08 ක් හඳුනාගෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 8 අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | පළාත් සභාවට එරෙහිව පවරා ඇති නඩු සම්බන්ධයෙන් පළාත් සභා අරමුදලින් නිශ්චිතව ගෙවිය යුතු අසම්භාව්‍ය බැරකම් හඳුනා ගැනීමක් සිදු නොවූ හෙයින් පළාත් සභා අරමුදලේ හෙළිදරව් කිරීමක් සිදු කර නොමැත. ඉදිරියේදී එවැනි නිශ්චිතතාවයන් සනාථ කිරීමෙන් අනතුරුව හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 8 අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේ වාණිජ අත්තිකාරම් ගිණුම් 05 කට අදාළව උපයා තිබූ එකතුව රු. 41,689,849 ක් වූ ලාභය පළාත් සභා මුදල් රීති 510.2(ආ) ප්‍රකාරව පළාත් සභා ආදායමට බැර කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ නිෂ්පාදන කටයුතු සඳහා අමුද්‍රව්‍ය මිලදීගැනීම, කාර්මික වැටුප් ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් ශේෂයක් රඳවා ගත යුතු බැවින් ලාභය පළාත් සභා අරමුදලට බැර කර නොමැත. | පළාත් සභා මුදල් රීති 510.2(ආ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ලැබෙන මුදල් ප්‍රවාහයන් සැලකිල්ලට ගනිමින් ලාභය පළාත් සභා අරමුදලට බැර කිරීමට කටයුතු කෙරේ. අදාළ වර්ෂයේ ලාභවලින් , ඔක්කම්පිටිය බීජ ගොවිපලෙන් රු.මි. 15 ක්ද යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලයෙන් රු.මි 1 ක්ද මුද්‍රණාලයෙන් රු.මි. 3 ක්ද 2023.04.11 දින වන විට පළාත් සභා අරමුදලට බැර කර ඇත. | |
| (ඇ) | වාණිජ අත්තිකාරම් ගිණුම් 03 කට අදාළව 2022 වර්ෂය වෙනුවෙන් වෙන්කරන ලද රු. 19,884,214 ක් වූ ස්ථාවර වත්කම් ක්ෂය පළාත් සභා මුදල් රීති 509.1 ප්‍රකාරව පළාත් භාණ්ඩාගාර ක්ෂය සංචිත අරමුදලට බැරකර නොතිබුණි. | අදාළ වාණිජ අත්තිකාරම් ගිණුම්වල ක්ෂය ගැලපීම් සිදු කර ඇතත් මුදල් රීති ප්‍රකාරව ඊට අදාළ ක්ෂය සංචිත වශයෙන් පළාත් අරමුදලට බැර කළයුතු වුවද මුදල්මය වශයෙන් ගිණුම්වල නොමැති හෙයින් පළාත් අරමුදලට එවීමට කටයුතු කර නොමැත. ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් රඳවා ගෙන පළාත් සභා අරමුදලට මුදල් එවීමට කටයුතු කරන ලෙස දැනුවත් කර ඇති අතර වාණිජ අත්තිකාරම් ගිණුම් 05 ක ක්ෂය සංචිතයට අදාළ මුදල් රු. 3,093,628 ක් මේ වන විට පළාත් සභා අරමුදලට බැර කර ඇත. | පළාත් සභා මුදල් රීති 509.1 අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු රු. 1,894,574 ක් වූ පෙර ගෙවුම් ශේෂය තුළ රු. 521,967 ක් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් එම වටිනාකමෙන් සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම්, මුළු පුනරාවර්තන වියදම සහ ඌනතාවය අධිගණනය වී තිබුණි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය මගින් ඉදිරියට ගෙවීම් ගණනය කර වාර්තා කිරීමේදී දෝෂයක් සිදුවී ඇති අතර මෙම ශේෂයන් හේතුවෙන් සිදු වන බලපෑම් ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. | පෙර ගෙවුම් ශේෂය මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්විය යුතුය. |
| (ඉ) | වසර 05 කට අධික කාලයක සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ බලයලත් අත්තිකාරම් ගිණුම් කටයුතුවලින් ලැබිය යුතු ලෙස දක්වා තිබුණු රු. 4,816,374 ක ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ | 2022.12.31 දිනට බලයලත් අත්තිකාරම් ගිණුම් කටයුතුවලින් ලැබිය යුතු ගිණුම් වශයෙන් සඳහන් වූ ශේෂය කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ නොපියවූ අග්‍රිම ගිණුමට ජර්නල් | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් තොරතුරු වාණිජ |

| | | | |
|---|---|---|---|
| | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව නොපියවූ අග්‍රිම ශේෂයක් ලෙස දක්වා තිබුණද, එම ආයතනයේ පොත්පත් හා ලේඛන අනුව එවැනි ශේෂයක් නොතිබුණි. | සටහන් මගින් මාරු කර ඇත. ඒ අනුව, අදාළ ආයතනය මේ සම්බන්ධයෙන් දැනුවත් කර ඇති අතර එම ශේෂයන් එම ආයතනයේ සමුච්චිත අරමුදල මගින් ගැලපීමට කටයුතු සිදු කර අදාළ මුදල් පළාත් අරමුදලට එවන ලෙස උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, රු. 4,816,374 ක මෙම මුදලින් රු. 4,550,955 ක මුදලක් 2023.05.16 දින වන විට ලැබී ඇත. | අත්තිකාරම් ගිණුම්වල ඇතුළත් තොරතුරු සමඟ එකඟවිය යුතුය. |
| (ඊ) | 2022 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබූ ආයතන 10 ක උපචිත වියදම, එම ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ විසර්ජන ගිණුම්හි බැරකම් වටිනාකම සමඟ රු. 96,708,302 කින් නොසැසඳුණි. | මෙම එක් එක් ගිණුම් ඒකකයන් විසර්ජන ගිණුම් වලින් කරන ලද වාර්තා කිරීම් වලට අනුව එමගින් සිදු වී ඇති බලපෑම ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී. අදාළ ආයතන වෙතින් මේ පිළිබඳව හේතු විමසීම් සිදු කර ඇත. ඉදිරි වර්ෂය තුළදී පළාත් භාණ්ඩාගාරය වෙතින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පමණක් විගණනය සඳහා ගිණුම් ඉදිරිපත් කිරීමට සටහන් කර ගෙන ඇත. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් තොරතුරු ආයතනවලට අදාළ විසර්ංන ගිණුමේ ඇතුළත් තොරතුරු සමඟ එකඟවිය යුතුය. |
| (උ) | ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම අනුව පොදු තැන්පත් ගිණුමේ ශේෂය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව ඊට අදාළව ඉදිරිපත් කර තිබූ ශේෂය සමඟ රු. 74,411,154 කින් නොසැසඳුණි. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති මුදල නිවැරදිය. විසර්ජන ගිණුමේ තොරතුරු දැක්වීමේදී වැරදි තොරතුරු ඉදිරිපත් කිරීමක් සිදු කර ඇත. ඉදිරියේදී විසර්ජන ගිණුමේ වැරදි නිවැරදි කර ගැනීම සඳහා උපදෙස් ලබා දී ඇත. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් තොරතුරු ආයතනවලට අදාළ විසර්ංන ගිණුමේ ඇතුළත් තොරතුරු සමඟ එකඟවිය යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ඌව පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනුලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවධානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය 700 - ආණ්ඩුකාරවර කාර්යාලය

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව පළාත් ආණ්ඩුකාරවරයාට අතිරේක නිවසක් ලෙස ප්‍රධාන අමාත්‍ය නිල නිවස ලබාදී තිබුණු අතර එම නිවස, කුලී අයකිරීමකින් තොරව ආණ්ඩුකාරවර කාර්ය මණ්ඩලය සඳහා පාවිච්චියට ලබාදී තිබුණි. ඒ සඳහා 2021 ජනවාරි සිට 2022 ඔක්තෝබර් දක්වා කාලයට අදාළව එම කාර්ය මණ්ඩලය විසින් ගෙවිය යුතු රු.314,761 ක් වූ ජල බිල්පත් හා විදුලි බිල්පත් වියදම ඌව පළාත් සභා අරමුදලින් ගෙවා තිබුණි. | ප්‍රධාන අමාත්‍යතුමා වෙත වෙන්ව ඇති නිල නිවස ඒ හා සමාන තත්ත්වයේ වෙනත් අයෙකු නොමැති බැවින් සහ මෙම නිල නිවස නිසි නඩත්තුවකින් යුතුව පවත්වාගෙන යායුතු බැවින් ඉහත අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන ආණ්ඩුකාරතුමා වෙත තාවකාලික ප්‍රයෝජනය සඳහා වෙන් කර දී ඇත. | ප්‍රධාන අමාත්‍ය නිල නිවාසය භාවිතා කිරීම වෙනුවෙන් නිවාස කුලී අයකරගත යුතු අතර විදුලි හා ජල බිල්පත් පියවීම සඳහා පළාත් සභා අරමුදලින් දරන ලද වියදම් නිවස උපයෝජනය කළ කාර්ය මණ්ඩලයෙන් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.2 ශීර්ෂය 701 - සභා ලේකම් කාර්යාලය**

**(අ) අනුකූල නොවීම්**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **කළමනාකරණ සේවා චක්‍රලේඛ** | | | |
| අංක 03/2018 හා 2018 ජුලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයේ II ඡේදය | මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව සිය ආයතනවල කාර්ය මණ්ඩලය වෙත ගෙවනු ලබන දීමනා තීරණය කිරීමෙන් වැලකිය යුතු බව දක්වා තිබිය දී ඌව පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලයේ නිලධාරීන් 28 දෙනෙකුට 2022 ජනවාරි 01 දින සිට 2022 ජුනි 30 දක්වා ඔවුන්ගේ මූලික වැටුපෙන් සියයට 25 ක් වන පරිදි රු. 1,505,817 ක විශේෂ දීමනාවක් ගෙවීම් කර තිබුණි. | මෙම දීමනාව ගෙවා ඇත්තේ ඌව පළාත් සභාවේ 2017 අංක 03 දරන ප්‍රඥප්තිය අනුව වේ. පළාත් සභාව සක්‍රීයව ක්‍රියාත්මක නොවන හෙයින් මේ වන විට මෙම දීමනාව තාවකාලිකව නවතාලීමට කටයුතු කර ඇතත් අදාළ ප්‍රඥප්තිය තව දුරටත් බලාත්මකව පවතී.2023.05.09 දින පැවති රාජ්‍ය ගිණුම්කාරක සභාවේදී මේ සම්බන්ධයෙන් පවතින නෛතික බලය පරීක්ෂා කිරීම සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත රාජ්‍ය ගිණුම්කාරක සභාව විසින් නියෝග කර ඇත. | 2018 ජුලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

**(ආ) ආර්ථික නොවූ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 6 වන ඌව පළාත් සභාවේ නිල කාලය අවසන් වීමෙන් පසුව නාමික ධූරයක් වූ සභාපතිවරයාගේ පෞද්ගලික කාර්ය | පළාත් සභා නිල කාලය අවසන් වීමෙන් පසුව ඊලග සභාව රැස්වනතුරු සභාපති තනතුර පවතී. | පළාත් සභාව විසුරුවා ඇති අවස්ථාවන |

| | | |
|---|---|---|
| මණ්ඩලයේ නිලධාරීන් 11 දෙනෙකු වෙනුවෙන් 2022 ජනවාරි 01 දින සිට 2022 ජුලි 31 දින දක්වා ඌව පළාත් සභාවට කිසිදු සේවයක් ලබා ගැනීමෙන් තොරව වැටුප් හා දීමනා වශයෙන් රු. 4,170,265 ක් ගෙවා තිබුණි. | ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක පීඑස්/සීඑස්ජ්/11-18(ii) මගින් සභාපතිතුමාගේ පෞද්ගලික කාර්යමණ්ඩලය සඳහා රියදුරන් 02 ක් හිමි බව දන්වන ලද අතර ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද අංක පීඑස්/සීඑස්ජ්/11-18(ii) හා 2022 ඔක්තෝබර් 18 දිනැති චක්‍රලේඛ අනුව එක් පෞද්ගලික ලේකම්වරයෙකු, කළමනාකරණ සහකාරවරුන් දෙදෙනෙකු, කාර්යාල කාර්ය සහායකවරයෙකු සහ රියදුරෙකු ලෙස කාර්යමණ්ඩලය පත්කර ඇත. දැනට මෙම චක්‍රලේඛ ප්‍රකාරව අනුමත සේවක සංඛ්‍යාවට පමණක් වැටුප් හා දීමනා ගෙවීමට කටයුතු කර ඇත. | සභාපතිවරයාගේ පෞද්ගලික කාර්යමණ්ඩලය සඳහා ගෙවන ලද මුදල් නැවත අය කර ගත යුතුය. |

**1.5.3 ශීර්ෂය 705 - ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ පේෂකර්ම හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය**

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව පළාත් සංචාර ප්‍රවර්ධන ඒකකය විසින් 2013, 2014 හා 2020 වර්ෂයන්හිදී, සංචාරක ප්‍රවර්ධනය අරමුණ කර ගෙන රු. 3,581,500 ක මුද්‍රණය කර තිබුණු පොත් වලින් 2022 සැප්තැම්බර් වන විට, පිරිවැය රු.2,847,825 ක් වූ පොත් 3930 ක් අදාළ අරමුණ ඉටුකර ගැනීම වෙනුවෙන් යොදා නොගෙන ගබඩා වල නිෂ්කාර්යව පැවතුණි. | මෙම පොත් මුද්‍රණය කිරීමේදී මුද්‍රණ වාසි ලබා ගැනීමේ අරමුණින් එකවර ඉදිරි අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන මුද්‍රණ කටයුතු සිදුකළ නමුත් මෙය එකවර භාවිතයට නොගෙන අවස්ථානුකූලව භාවිතයට ගැනීම සිදු වේ. එම ග්‍රන්ථ වලින් Resplendent Uva, Visit Uva Sri Lanka, කඳුකර පාරාදීසය යන ග්‍රන්ථ මධ්‍යම සංස්කෘතික අරමුදල සතු ප්‍රකාශන අලෙවි මධ්‍යස්ථාන මගින් විධිමත් පරිදි අලෙවි කිරීමට කටයුතු කර ඇති අතර වෙබ් අඩවි සහ ඩිජිටල් අවකාශයන් තුළින් අලෙවි කිරීමට සහ සංචාරක නියෝජිත ආයතන හා රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයින් මගින් මෙම ග්‍රන්ථ ලබා දීම සඳහා | අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුතු අතර මෙම පොත් විනාශවීම වළක්වා ගැනීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | ප්‍රචාරණයක් සිදු කර ඇත. තවද මහියංගණ සංචාරක මධ්‍යස්ථානය සහ ඇල්ල සංචාරක තොරතුරු මධ්‍යස්ථානයේ විධිමත් ක්‍රමවේදයක් සකස් කර මෙම පොත් සංචාරක ප්‍රවර්ධනය සඳහා යොදවා ගැනීමට කටයුතු කර ඇත. | |

**(ආ) ආර්ථික නොවූ ගනුදෙනු**

| | | |
|---|---|---|
| ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමෙන් තොරව 2013 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කරන ලද, උඩවලව සංචාරක විවේකාංගණයට 2022 වර්ෂය වන විට ඌව පළාත් සභාව මගින් රු. 40,918,644 ක් වැයකර තිබුණ ද 2022 අගෝස්තු වන විට ද මෙම විවේකාංගණය හා කඩ කාමර සංචාරකයින් සඳහා විවෘත කර නොතිබීම මත වැය කළ මුදලින් පළාත් සභාවට මෙතෙක් ආදායම් උපයා ගැනීමට නොහැකිව තිබුණි. | මෙම ස්ථානය දේශීය විදේශීය සංචාරකයින් සඳහා සේවාවක් සැපයීම වෙනුවෙන් 2023.04.11 දින අදාළ පාර්ශවය වෙත විධිමත් පරිදි ගිවිසුම්ගතව භාරදී ඇති අතර, ඒ අනුව අදාළ පාර්ශවය විසින් එම සේවාව සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත්ව කටයුතු කරමින් පවති. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර පළාත් සභාවට ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.5.4 ශීර්ෂය 706 - කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කටයුතු අමාත්‍යාංශය

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 20 කට අධික කාලයක සිට පළාත් සභා මූල්‍ය ප්‍රකාශනවල වත්කම් වශයෙන් දැක්වෙන, බීජ අර්තාපල් විශේෂ අත්තිකාරම් ගිණුමේ හර ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 9,674,749 ක් වූ අතර මෙම ශේෂය ණය පදනම මත බීජ අර්තාපල් ලබාගත් නිලධාරීන් 387 දෙනෙකුගෙන් මාසිකව අයකර ගතයුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 34 දෙනෙකුගෙන් රු. 323,500 ක් පමණක් අයකර ගැනීමෙන් එම ණය ක්‍රමාණුකූලව අයකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මෙම ණය මුදල අයකර ගැනීම සඳහා විවිධ ක්‍රමවේදයන් අනුගමනය කරමින් පවතින අතර අදාළ ණය ශේෂයන් අයකර එවන ලෙස අදාළ ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇත. | ණය ශේෂය කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.5 ශීර්ෂය 709 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය

**කාර්ය මණ්ඩල පරිපාලනය**

**(අ) පළාත් සභා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා කාර්යාල**
**(පාසල් හා සෞඛ්‍ය කාර්ය මණ්ඩලය හැර)**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ද්විතික මට්ටමේ නිලධාරීන් 487 ක් හා වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) සේවකයින් 64 ක් අතිරික්තව සේවයේ යොදවාගෙන තිබුණි. ජ්‍යෙෂ්ඨ, තෘතියික හා ප්‍රාථමික මට්ටම්වල පුරප්පාඩු සංඛ්‍යාව 703 ක් විය. | අතිරික්තව පවතින ද්විතික මට්ටමේ කාර්යය මණ්ඩලය තුළ ජාතික ප්‍රතිපත්තියක් අනුව බඳවා ගන්නා ලද සංවර්ධන නිලධාරීන් ඇතුළත්ව ඇත. | කාර්යමණ්ඩලය තුලනාත්මකව පවත්වාගෙන යාමට පියවර ගත යුතුය. |

**(ආ) පාසල් කාර්ය මණ්ඩලය**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ගුරු සේවය සඳහා 591 ක් ගුරු සහායක කාර්ය මණ්ඩලය සඳහා 1632 ක් සහ වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) සේවකයින් 11 ක් අතිරික්ත සේවයේ යොදවාගෙන තිබුණි. විදුහල්පති සේවයේ තනතුරු 409 ක් පුරප්පාඩුව පැවතුණි. | අනුමත ගුරුවරුන් සංඛ්‍යාව 17,026 ක් වේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලද තොරතුරුවල ඇතුළත් 642 ක කාර්යය මණ්ඩලය මේ තුළට එකතු විය යුතු බැවින් අතිරික්ත ගුරු කාර්යය මණ්ඩලයක් නොපවතින බව සඳහන් කරමි. එමෙන්ම සහයක කාර්යය මණ්ඩලයේ අතිරික්ත කාර්යය මණ්ඩලය පවතිනුයේ ජාතික ප්‍රතිපත්තියක් අනුව බඳවා ගන්නා ලද සංවර්ධන නිලධාරීන් වේ. | ගුරුවරුන් හා විදුහල්පතිවරුන් තුලනයක් පවත්වා ගැනීමට පියවර ගත යුතුය. |

**(ඇ) සෞඛ්‍ය කාර්ය මණ්ඩලය**

| | | |
|---|---|---|
| සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතික හා ප්‍රාථමික මට්ටම්වල පුරප්පාඩු සංඛ්‍යාව 1007 ක් පවතින අතර එම පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතික හා ප්‍රාථමික මට්ටම්වල පුරප්පාඩු සංඛ්‍යාව 994 ක් වන අතර අතිරික්ත කාර්ය මණ්ඩලය 124 කි. | කාර්යමණ්ඩලය තුලනාත්මකව පවත්වා ගත යුතුය. |

**1.5.6 ශීර්ෂය 710 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

**(අ) වත්කම් කළමනාකරණය**

**නඩත්තු හා අලුත්වැඩියා කටයුතු සිදුනොකිරීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2016 සිට 2021 කාලපරිච්ඡේදය තුළ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 05 ක් අලුත්වැඩියා කටයුතු සඳහා පෞද්ගලික ආයතන වෙත භාරදී තිබුණු නමුත් 2022 දෙසැම්බර් 31 වන විටත් එම වාහන අලුත්වැඩියා කර නැවත ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට ලබාගෙන නොතිබුණි | මෙම වාහන අනතුරුවලට ලක් වී ඇති අතර මේ වන විට අලුත්වැඩියා කටයුතු සඳහා යොමු කර ඉදිරි කටයුතු සිදු වෙමින් පවතී. | දීර්ඝ කාලයක සිට අළුත්වැඩියා කටයුතු සඳහා පෞද්ගලික ආයතන වෙත භාරදී ඇති වාහන කඩිනමින් අළුත්වැඩියා කර නැවත ආයතනය වෙත ලබාගත යුතුයි. |
| (ii) | 2020 – 2022 කාල පරිච්ඡේදය තුල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 09 ක් අලුත්වැඩියා කටයුතු සඳහා කහගොල්ල පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය වෙත භාරදී තිබුණු නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් එම වාහන අලුත්වැඩියා කර නැවත ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට ලබාගෙන නොතිබුණි. | වාහන අලුත්වැඩියා කිරීමට පළාත් වාහන අලුත්වැඩියා ඒකකයට යොමු කර ඇති අතර වාහන අලුත්වැඩියා කටයුතු සිදු කර භාවිතයට ලබා දීමට උපදෙස් ලබා දී ඇත. | වාහන අළුත්වැඩියා කටයුතු කඩිනමින් සිදුකර ප්‍රයෝජනයට ගත යුතුයි. |

**(ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| | | | |
|---|---|---|---|
| (i) | ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් පළාත් සභා ප්‍රතිපාදන මත, 2021 වර්ෂයේදී රු.4,021,483 ක් වැයකර, බණ්ඩාරවෙල දිස්ත්‍රික් රෝහලෙහි වෛද්‍ය වායු පද්ධතියක් ස්ථාපිත කිරීමේ කටයුතු 2021 අගෝස්තු 17 දින වන විට අවසන් කර තිබුණු අතර 2022 නොවැම්බර් 18 දින වන විටත් මෙම පද්ධතිය නිෂ්කාර්යව පැවතුණි. | කොවිඩ් වසංගත තත්ත්වය උග්‍ර තත්ත්වයකට පත්ව තිබූ අවස්ථාවකදී පැවති අධි අවධානම් සහිත රෝගීන් වෙත අවශ්‍ය ඔක්සිජන් සැපයීම ඉහළ මට්ටමක පවතින බව සෞඛ්‍ය අංශය විසින් දැන්වීමෙන් පසු මෙසේ වෛද්‍ය වායු පද්ධතිය ස්ථාපිත කිරීමට කටයුතු සිදු කෙරුණි. සෞඛ්‍ය අංශ විසින් ලබාදුන් උපදෙස් | වත්කම් කඩිනමින් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අනුව කොවිඩ් වසංගත තත්ත්වය උත්සන්න වූ අවස්ථාවේ බදුල්ල මහ රෝහලේ පැවති ධාරිතාවය පාලනය කර, රෝගීන්ට උපරිම සේවාවක් සැපයීම සඳහා මෙම වෛද්‍ය වායු පද්ධතිය භාවිතා කිරීමට සැලසුම් කළ ද කොවිඩ් රෝගී තත්ත්වය ක්‍රමයෙන් පහව ගිය බැවින් ඉදිරියේදී අනෙකුත් රෝගීන් සඳහා භාවිතා කිරීමට කටයුතු සැලසුම් කර ඇත. | |
| (ii) | මොනරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සහ ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශයේ ඖෂධ ගබඩාව සඳහා 2016 සිට 2019 දක්වා කාල පරිච්ඡේදය තුළ රු. 5,802,925 ක් වැයකර මිලදී ගෙන තිබුණු සූර්ය කෝෂ විදුලි පද්ධති 02 ක් 2022 දෙසැම්බර් 15 දින වන විටද ක්‍රියාකාරි තත්ත්වයේ නොතිබුණි. | කොන්ත්‍රාත් ආයතනය දැනුවත් කර ඇති අතර, ඉදිරියේදී එය යථා තත්ත්වයට පත් කිරීම සඳහා අදාළ ආයතනය සමඟ කටයුතු සිදු වෙමින් පවතී. | කඩිනමින් යථා තත්ත්වයට පත්කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුයි. |

### 1.5.7 ශීර්ෂය 711 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**පාසල් කාර්ය මණ්ඩලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මහියංගනය අධ්‍යාපන කලාපයේ පාසල්වල ගුරුවරු 142 දෙදෙනෙකුගේ ඌනතාවයක් පැවතියදී එම අධ්‍යාපන කලාපයේ පාසල්වලට පත්වීම් ලද ගුරුවරුන් 23 දෙනෙකු මොනරාගල සහ වැලිමඩ කලාපය, මහියංගනය කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල යන ආයතනවලට සහ මහියංගනය අධ්‍යාපන කලාපයෙන් පිටත පාසල්වලට අනුයුක්ත කර 2022 මාර්තු මස සිට ඔක්තෝබර් මාසය දක්වා වූ කාලය තුළ වැටුප් වශයෙන් රු. 2,717,137 ක් ගෙවීම් කර තිබුණි. | රටේ පැවති ඉන්ධන අර්බුදය හමුවේ රජය මගින් ගන්නා ලද තීරණයකට අනුව අදාළ ගුරු භවතුන් තම නිවස ආසන්නයේ පවතින පාසල් සඳහා තාවකාලිකව අනුයුක්ත කරන ලද අතර, මේ වන විට අදාළ අනුයුක්ත කාලය අවසන් වී නිත්‍ය සේවා ස්ථානවල සේවයට වාර්තා කර ඇත. තවද මෙම කලාපයේ ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ඉදිරියේදී කටයුතු කරමින් පවතී. | පාසල්වල ගුරුවරු 142 දෙනෙකුගේ ඌනතාවයක් පැවතියදී ගුරු තුලනයකින් ගුරු ඌනතා සම්පූර්ණ කිරීමට වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමුවිය යුතුයි. |
| (ii) | මහියංගනය අධ්‍යාපන කලාපයේ 2000 – 2016 කාලපරිච්ඡේදය සඳහා ගුරු සේවා ව්‍යවස්ථාවට ඇතුළත් නොවන ගුරු උපදේශක තනතුරු 24 ක් වෙනුවෙන් | මේ වන විට ගුරු උපදේශක සේවයේ සේවා ව්‍යවස්ථාව අනුමත කර ඇති අතර, අනුමත පුරප්පාඩු සඳහා මේ වන විට සේවයේ නියුතු ගුරු | ගුරු උපදේශකවරු නිශ්චිත බඳවා ගැනීමේ |

| | | | |
|---|---|---|---|
| | ගුරුභවතුන් 24 ක් පත්කර 2020 ජනවාරි මාසයේ සිට 2022 සැප්තැම්බර් මාසය දක්වා වූ කාලච්ඡේදයට එකතුව රු. 72,059,450 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. | උපදේශකවරුන් අන්තර්ග්‍රහණ කටයුතු සිදු කරමින් පවති. | පටිපාටියක් මත බඳවාගත යුතු අතර ගුරුවරුන් ගුරු ඌනතාවයට පිළියම් යෙදීම සඳහා යොදාගත යුතුය. |
| (iii) | මහියංගනය අධ්‍යාපන කලාපයේ පාසල් කාර්යමණ්ඩල තොරතුරු වලට අනුව රසායනාගාර සහයක, පාසල් කම්කරු හා සනීපාරක්ෂක කම්කරු යන තනතුරු කාණ්ඩ 03 ට අයත් සේවකයින් 42 දෙදෙනෙකු අතිරික්තව පැවති අතර එම අතිරික්ත කාර්යමණ්ඩලය වෙනුවෙන් කලාප අධ්‍යාපන කාර්යාලය විසින් 2020, 2021 හා 2022 වර්ෂ වලදී රු. 56,041,482 ක් වැටුප් ගෙවා තිබුණි. | මෙම සේවක මහතුන් දැනට පාසල්වලට අනුයුක්ත කර සේවයේ යොදවා ඇත. ඉදිරියේ දී අතිරික්ත තනතුරු සඳහා සේවකයින් බඳවා නොගෙන පුරප්පාඩු ඇතිවීම මත මෙම අතිරික්ත සේවකයන්ගෙන් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර ඇත. | කාර්යමණ්ඩලය තුලනය කර සේවකයින්ගෙන් ඵලදායි හා කාර්යක්ෂම සේවයක් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.8 ශීර්ෂය 712 - පළාත් පාලන දෙපාර්තමේන්තුව**

**(අ) පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය**

**හිඟ ආදායම්**

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ වෙනුවෙන් ඌව පළාතේ පළාත් පාලන ආයතන වලට ලැබිය යුතු වරිපනම් බදු හා වෙනත් ආදායම් රු. 889,963,278 ක් අයකර ගෙන නොතිබුණි. | 2023.03.31 දිනට රු. 345,408,534 ක් තව දුරටත් අයවිය යුතුව ඇත. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ii) | 1979 අංක 42 දරන මහ නගර සභා හා නගර සභා (සංශෝධිත) පනතේ සහ 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 129(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පළාත් පාලන ආයතන වලට අය විය යුතු උසාවි දඩ රු. 99,826,070 ක් හා මුද්දර ගාස්තු රු. 193,145,930 ක් පළාත් පාලන ආයතන වලට ලබා දී නොතිබුණි. | පළාත් පාලන ආයතනවලට අදාළව ඉල්ලීම් කරන ලද මුදල් උසාවි දඩ හා මුද්දර ගාස්තු අදාළ ආයතන වෙත ගෙවීමට කටයුතු කර ඇත. | පළාත් පාලන ආයතන වලට අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු එම ආයතන වලට ලබාදීමට කටයුතු කළ යුතුය. |

**(ආ) නිකුත් කර තිබුණු අධිහාර සහතික වෙනුවෙන් අයවීමට ඇති මුදල්**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඌව පළාතේ පළාත් පාලන බල මණ්ඩලවල නිලධාරීන්ට හා නියෝජිතයින්ට පනවා තිබුණු අධිහාර 06 ක් වෙනුවෙන් වෙනුවෙන් රු. 5,436,543 ක් අය කරගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 4,713,213 ක් අයවිය යුතු වේ. | අධිහාර අයකර ගැනීමට කඩිනම් පියවර යුතුය. |

**1.5.9 ශීර්ෂය 713 - සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

**අනුකූල නොවීම**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2011 අංක 03 දරන ඌව පළාත් සභා සමූපකාර සමිති ප්‍රඥප්තියේ 46 වන වගන්තිය ප්‍රඥප්තියට අදාළ රීති මාලාවේ 43 වන රීතිය අනුව ස්ථාපනය කර ඇති ඌව පළාත් සමූපකාර සංවර්ධන අරමුදල් ව්‍යවස්ථාවේ 10(1) වගන්තිය | සමූපකාර අරමුදල් ව්‍යවස්ථාවේ පොදු කොන්දේසි අනුව සමූපකාර අරමුදලට දායක මුදල් ගෙවීම පැහැර හැර ඇති සමිති සඳහා ණය හෝ ආධාර ලබානොදිය යුතු වුවත් දායක මුදල් ගෙවීම පැහැර හැර ඇති සමිති 04 ක් සඳහා රු. 8,000,000 ක ණය ලබා දී තිබුණි. | සමූපකාර සංවර්ධන අරමුදලට රැස්වී ඇති මුදල් ජංගම ගිණුම, ස්ථාවර තැන්පත් ගිණුම තුළ රැස්කර තබා තිබෙනවාට වඩා සමිතිවල ව්‍යාපාර කටයුතු සිදුකරගෙන යාමට ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් සැලසීම අරමුණුකර ගෙන ණය මුදල් නිදහස් කර ඇති අතර සමූපකාර අරමුදලට අයවීමට ඇති හිඟ දායක මුදල් සහ ණය මුදල් අයවෙමින් පවතින අතර මේ වන විට සමිති 02 කින් ගෙවිය යුතු ණය මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන් කර ඇත. | ඌව පළාත් සමූපකාර සංවර්ධන අරමුදල් ව්‍යවස්ථාවට අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.10 ශීර්ෂය 714 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 10 කට පෙර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිදුවී ඇති රු. 440,990 වැටුප් මුදල් අතුරුදහන්වීමේ මූලාා වංචාව 2022 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | මෙහි පරීක්ෂණ කටයුතු තවමත් සිදු වෙමින් පවතින අතර මේ වන තෙක් ඒ සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගෙන නොමැති බව සඳහන් කර ඇත. | නිරවුල් නොවූ ශේෂය වගකිව යුතු නිලධාරීන්ගෙන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.11 ශීර්ෂය 715 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය විසින් රු.මිලියන 48 ක් වැයකර ඕස්ට්‍රේලියාවෙන් ආනයනය කරන ලද උසස් වර්ගයේ කිරි එළදෙනුන් 100 දෙනෙකු 2017 දෙසැම්බර් 24 දින බොරලන්ද රජයේ සත්ත්ව ගොවිපලට ලබාදී තිබුණ ද එකී කිරි එළදෙනුන්ගෙන් 32 ක් හා ඔවුන්ගෙන් බිහිවූ පැටවුන් 119 ක් 2018 සිට 2022 අගෝස්තු 15 අතර කාලයේදී මියගොස් තිබූ අතර එයට ගොවිපල කළමනාකාරිත්වයේ අකාර්යක්ෂමතාවය හේතුවී තිබුණි. | විදේශ රටක සිට ආනයනය කරන ලද මෙම සතුන් අප රටේ දේශගුණික හා කාලගුණික තත්ත්වයන්ට අනුගත නොවීම හේතුවෙන් රෝගී තත්ත්වයන්ට මුහුණ දීම,ශ්‍රී ලංකාවේ පවතින රෝග තත්ත්වයන්ට ඔරොත්තු නොදීම , නියමිත ප්‍රමිතියෙන් යුක්ත ගව ගාල් නොපැවතීම ,විදේශීය සතුන්ට ගැලපෙන ආහාර නොමැති වීම නිසා පෝෂණ ඌනතා ඇති වීම ආදි හේතුන් නිසා සතුන් මිය ගොස් ඇත. | නිසි ශක්‍යතා අධ්‍යනයෙන් තොරව මෙම මිලදී ගැනීම සම්බන්ධව කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව කටයුතු කළ යුතුය.. |
| (ii) | බොරලන්ද රජයේ සත්ත්ව ගොවිපල අක්කර 220 ක පමණ භූමි ප්‍රමාණයක් පුරා පැතිර ඇති අතර එයින් අක්කර 50 ක් පමණ තෘණ වගාව සඳහා යොදාගත හැකි බව නිරීක්ෂණය විය. එසේ උවද 2022 වර්ෂය වන විට අක්කර 14 ක් පමණක් තෘණ වගාව සඳහා යොදා ගැනීම හේතුවෙන් ගව ආහාර සඳහා ගොවිපල තුළින් තෘණ ලබාදීම සීමාවී තිබුණි. එසේම 2018 | 2018 වර්ෂයේ තෘණ වගාව ආරම්භ කරන ලද අතර ඒ වන විට ගොවිපල ඉදිකිරීම්, ගාල් සේදීම වැනි ගොවිපලේ අනෙකුත් කටයුතු සඳහා ද භාවිතා කිරීමට තිබූ එකම ජල මූලාශ්‍රය ද වැව වූ අතර එවකට පැවති වියලි කාලගුණ තත්ත්වයත් සමඟ වැවේ තිබූ ජල ප්‍රමාණය ගොවිපලේ | ගොවිප සතුන්ට ගොවිපල තුළින් අවශ්‍ය තෘණ ලබාදීම සඳහා රුපියල් මිලියන 4.1 වියදම් කර ඉටුකළ ව්‍යාපෘතිය තුළින් |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන මත තෘණ වගාව සඳහා හා ජලනල එලීම සඳහා පිළිවෙලින් රු.2,071,407 ක් හා රු.2,031,291 ක් ලෙස එකතුව රු.4,102,698 ක් වැයකර තිබුණද අදාළ කටයුතු අඛණ්ඩව කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි. | සියලු කටයුතු සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් තෘණ වගාව විධිමත්ව නඩත්තු වීම සිදු වී නොමැත. නමුත් 2018 ආරම්භ කළ තෘණ වගාවෙන් යම් ප්‍රමාණයක් දැනට ඉතිරිව පවතින අතර එම තෘණ කපා සතුන්ට සැපයීම සිදු කරනු ලබයි. | සතුන්ගේ ආහාර අවශ්‍යතා සපුරාලීමට පියවර ගත යුතුය. |
| (iii) | උසස් වර්ගයේ දෙමුහුන් එළ ගවයින් අභිජනනය කර ඌව පළාත තුළ බෙදාහැර එමගින් දියර කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම, බොරලන්ද රජයේ සත්ත්ව ගොවිපල පවත්වාගෙන යාමේ ප්‍රධාන අරමුණක් වුවද, 2018 සිට 2022 අගෝස්තු දක්වා වූ වසර 05 කට ආසන්න කාලය තුළ ගොවිපල මගින් වැස්සි පැටවුන් 20 දෙනෙකු පමණක් කිරි ගොවීන්ට අලෙවි කර තිබීම හේතුවෙන් එම අරමුණ ඉටුවී නොතිබුණි. | විදේශ රටක සිට ආනයනය කරන ලද මෙම සතුන් යුරෝපීය ආරය සහිත දේශිය සතුන්ගේ මට්ටමට ප්‍රතිශක්තිය නොමැති වීම හා අප රටේ දේශගුණික හා කාලගුණික තත්ත්වයන්ට අනුගත නොවීම හේතුවෙන් සැලකිය යුතු ප්‍රමාණයක් මිය යන ලදි. එබැවින් අපේක්ෂා කල මට්ටමට එළ ගවයින් අභිජනනය කර වෙළඳපල වෙත නිකුත් කිරීමට නොහැකි විය. | ගොවිපල පවත්වාගෙන යාමේ අරමුණු ඉටුවන පරිදි කටයුතු කිරීමට කළමනාකාරිත්වය පියවර ගත යුතුය. |

### 1.5.12 ශීර්ෂය 716 - ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

**ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් දීර්ඝ කාලීනව බදුදීම වෙනුවෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් වාණිජ පදනමින් බදුකර ලෙස ලබාදී ඇති දීර්ඝකාලීන බදු බලපත්‍ර 110 කට අයත් බදුකරුවන් 109 දෙනෙකුගෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු. 81,827,636 ක හිඟ බදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | මෙම මුදලින් රු. 7,976,473 ක මුදලක් අයවී ඇත. බදු තක්සේරු මුදල සම්බන්ධයෙන් බදුකරුවන්ගේ අභියාචනා කිරීම් , බදුකරු මිය යාම, බදුකරය අහෝසි වීම සහ බදුකර සඳහා උද්ධමන ගැලපුම් සිදු කිරීම් අවශ්‍ය වීම වැනි හේතු මත මෙම හිඟ බදු අයකර ගැනීමේ බාධා පවතී. නමුත් හිඟ බදු අයකර ගැනීමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | අයවීමට ඇති හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.13 ශීර්ෂය 721 - ආයුර්වේද දෙපාර්තමේන්තුව**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් 2021 ජූනි 18 දින රු.256,250 ක් වැයකර Innovex – 7kg Fully Auto රෙදි සෝදන යන්ත්‍ර 05 ක් මිලදී ගෙන තිබුණ ද ඉන් රු. 205,000 ක් වටිනා යන්ත්‍ර 04 ක් 2022 නොවැම්බර් 30 දින වන විට නිෂ්කාර්යව පැවතුණි. | කොවිඩ් ප්‍රතිකාර ඒකක වාට්ටු සඳහා මෙම උපකරණ ලබාගත් අතර මේ වන විට වෙනත් ප්‍රතිකාර රෝහල් සඳහා එම උපකරණ භාවිතයට යොමු කර ඇත. | මෙම යන්ත්‍ර උපයෝගී කරගෙන රාජ්‍ය සේවාවන් පවත්වාගෙන යාම සඳහා දරන වියදම් අවම කර ගැනීමට පියවර ගත යුතුය. |

**1.5.14 ශීර්ෂය 726 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය**

**කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | එකතු කළ අගය මත බදු ගෙවන ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට බිල්පත් පියවීමේදී මුදල් ගෙවීමට පෙර එක් එක් කාලච්ඡේදයට අදාළව කොන්ත්‍රාත්කරුගේ බදුගොනුවල සක්‍රිය භාවය සනාථ කර ගැනීම සඳහා නිෂ්කාශන සහතික ලබා ගත යුතුය. එසේ උවද ඌව පළාත් සභාවට අයත් ආයතන දෙකක් විසින් ක්‍රියාත්මක කර තිබුණු සංවර්ධන ව්‍යාපෘති පහකට අදාළව ඒ අනුව කටයුතු නොකිරීම නිසා කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු එකතුව රු. 8,246,513 ක් එකතුකළ අගය මත බදු දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | ඌව පළාත් සහා රාජ්‍ය නිලධාරීන් සඳහා ඉදිකරමින් පවතින පස් මහල් නිල නිවාස සංකීර්ණයේ ඉදිකිරීම් කළ කොන්ත්‍රාත්කරු වන දෙනුවන් ඉංජිනියරින් පුද්ගලික සමාගම 114505005 දරන වැට් ලියාපදිංචි අංකය යටතේ සක්‍රිය බදුගෙවන්නෙකු බව දේශීය ආදායම් කොමසාරිස් විසින් නිකුත් කර ඇති 2017.06.09 දිනැති ලිපිය මගින් සනාථ කර ඇත. | බදු සක්‍රියභාවය සනාථ කරගෙන නිශ්කාශන සහතික මත වැට් බදු ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ඌව පළාත් සභාවේ නිලධාරීන් සඳහා පස්මහල් නිවාස සංකීර්ණයේ ඉදිකිරීම 2016 වර්ෂයේදී රුපියල් මිලියන 131.2 කට ඇස්තමේන්තු කර තිබුණු අතර රුපියල් මිලියන 88.1 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 2018 මැයි 09 දින වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණු මෙම කර්මාන්තය | මෙම කර්මාන්තය 2016 වර්ෂයේදී ආරම්භ කළ අතර ලංසු ප්‍රදානය පිළිනොගැනීම හේතුවෙන් අධිකරණ ක්‍රියාමාර්ගයකින් නතර විය. ඒ අනුව, 2 වන ප්‍රසම්පාදනය 2017.09.14 දින ආරම්භ කරන ලද අතර, 2019 වර්ෂයේ මුල දක්වා | කොන්ත්‍රාත්තුවට අදාළ ඉතිරිවැඩ කඩිනමින් නිමකර නිල නිවාසය නිලධාරීන් වෙත ලබාදීමට |

| | | | |
|---|---|---|---|
| | සඳහා කොන්ත්‍රාත්කරුවන්ට රුපියල් මිලියන 49.7 ක් ගෙවා තිබුණ ද මේ දක්වා කර්මාන්තය අවසන් කර නොතිබුණි. කර්මාන්තයේ ඉතිරි සියයට 45 ක ප්‍රමාද වූ වැඩ කොටස් නිම කරවා ගැනීම සඳහා රුපියල් මිලියන 155.2 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා නිසා මෙම කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතු වසර 04 ක ප්‍රමාදයක් නිරීක්ෂණය වන අතර ඇස්තමේන්තුව වරින්වර සංශෝධනය කිරීම මත රුපියල් මිලියන 88.1 කට ඉදිකිරීම් කටයුතු අවසන් කර දැමීමට හැකියාවක් තිබුණු කර්මාන්ත වෙනුවෙන් රුපියල් මිලියන 204.9 ක් වැය කිරීමට සිදුවී තිබුණි. ඒ අනුව මුල් ඇස්තමේන්තුව ඉක්මවා තවදුරටත් ඉටුකළ යුතු වැඩ කොටස් නිමකර ගැනීමට රුපියල් මිලියන 73.7 ක් වැඩිපුර දැරීමට සිදු වී තිබුණි. | සාර්ථකව ඉදිකිරීම් කටයුතු සිදුකරගෙන යන ලදි. 2019 වර්ෂය වන විට කොන්ත්‍රාත්කරුගේ දැඩි අසනීප තත්ත්වය හා ඔහුගේ ව්‍යාපාර කටයුතු කඩාවැටීම (Bankrupt) හේතුවෙන් 2020 වර්ෂයේදී තෙවන ප්‍රසම්පාදන කටයුත්තකට යොමු වූ අතර එවකට රටෙහි පැවති තත්ත්වය අනුව ඔහු විසින් ඒකපාර්ශවිකව ගිවිසුම අවලංගු කරන ලදී. 2022 වර්ෂයේදී නැවත වරක් ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත. එහිදී පවත්නා මුදල් තත්ත්වය අනුව කොටස් වශයෙන් ඉදිරි කටයුතු නිම කිරීමට සැලසුම් කර ඇත. 2023.05.09 දින පැවති පාර්ලිමේන්තු ගිණුම්කාරක සභාවට පැවති තත්ත්වය දැනුම් දීම සිදු කරන ලදී. | කඩිනමින් පියවර ගත යුතුය. |
| (iii) | රෝගී සත්කාරක සේවා ඉහළ නැංවීම සහ විදේශීය ජාතිකයින්ට ආයුර්වේද පහසුකම් සැපයීමෙන් ආදායම් ඉපයීම අරමුණු කරගෙන පළාත් විෂයය නිශ්චිත ප්‍රධාන (PSDG) යටතේ 2021 වර්ෂයේ රුපියල් මිලියන 05 ක ප්‍රතිපාදන හා ඉතිරි ප්‍රතිපාදන ඉදිරි වර්ෂවලදී වෙන්කර ගැනීමේ අපේක්ෂාවෙන් යුතුව බල්ලකැටුව ආයුර්වේද රෝහලේ මුළුතැන් ගෙය හා ෆාමසිය ඉදිකිරීමේ කර්මාන්තය ආරම්භ කර තිබුණි. මේ සඳහා ඌව පළාත් ආයුර්වේද කොමසාරිස් විසින් 2021 ජූලි 07 දින රු. 23,773,512 ක ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණු අතර පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයක් සමඟ රු. 19,298,823 ක සිවිල් වැඩ වටිනාකමකට 2021 සැප්තැම්බර් 06 දින ගිවිසුම් ගතවී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2022 මාර්තු 05 දින ඉදිකිරීම් කටයුතු නිම කිරීමට නියමිතව තිබුණ ද 2023 පෙබරවාරි 22 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී ඇස්තමේන්තුවේ සඳහන් වැඩකොටස් වලින් සියයට 45 ක පමණ ප්‍රමාණයක් ඉටුකර, ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි. ඉටුකරන ලද වැඩ කොටස් සඳහා රු. 2,158,689 ක් ගෙවා තිබුණි. | කර්මාන්තයේ ඉදිරි කටයුතු 2024 වර්ෂයේදී සිදු කිරීමට තීරණය කර ඇති අතර, ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව දැනට කර්මාන්තයේ ගිවිසුම අවලංගු කර ඇත.. | කොන්ත්‍රාත් පාලනය සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් දැඩි අවධානය යොමු කර ගිවිසුම්ගත කාලය තුළ කර්මාන්තයේ කටයුතු නිම කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.15 ශීර්ෂය 727 - පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**

**අනුකූල නොවීම**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **කළමනාකරණ සේවා චක්‍රලේඛ** | | | |
| අංක 03/2018 හා 2018 ජුලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයේ II ඡේදය හා අංක PS/PCMD/SD/01/08 හා 2019 මාර්තු 29 දිනැති ජනාධිපති ලේකම්ගේ ලිපිය | මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව මෙන්ම ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සහ මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ ලබාගැනීමෙන් තොරව ඌව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට 2018 වර්ෂයේ සිට 2022 පළමු අර්ධ වර්ෂය දක්වා දිරි දීමනා ලෙස රු. 29,920,368 ක් ගෙවා තිබුණි. | ඌව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ දිරි දීමනා ගෙවීම අංක 2142/91 හා 2019/09/28 දිනැති ගැසට් පත්‍රය මගින් සිදු කර ඇත.දිරි දීමනා ගෙවීම සහා අරමුදලක් ස්ථාපනය කල යුතු බව 1990 අංක 08 දරණ ඌව පළාත් මුදල් ප්‍රඥප්ති අංක 104 (4) යටතේ දක්වා ඇත. මෙම දිරි දීමනා ගෙවීම සහා අරමුදල් සපයා ගනු ලබනුයේ අඩු වටිනාකම් සහිත සාධන පත්‍ර පරීක්ෂා කර ඒ සදහා අතිරේක වන ගාස්තුවෙන් පළාත් සභා අරමුදලට බැරවන මුදල මගිනි. | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සහ මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ ලබාගැනීමට ක්‍රියාකළ යුතු අතර 03/2018 හා 2018 ජුලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. |

## 1.5.16 ශීර්ෂය 736 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) කාර්යාලය

**(අ) අනුකූල නොවීම**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(I) ආයතන සංග්‍රහය** | | | |
| ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ විධිවිධාන හා 2004 ජනවාරි 08 දිනැති අංක 2004/01 දරන ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ ණය ශේෂ නිරවුල් කිරීම පිළිබඳ චක්‍රලේඛය. | ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාලවල සේවය කර මියගිය හා විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ සහ සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 74,528,288 ක ණය ශේෂය සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2022.12.31 දිනට පවතින ණය ශේෂය රු. 72,243,988 ක් වන අතර මෙම ණය ශේෂයන් පවතිනුයේ මධ්‍යම රජයේ සහ පළාත් සභා ආයතන අතරය. මීට අමතරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු ණය ශේෂය රු. 16,058,475 කි. මෙම ණය ශේෂයන් අදාළ පළාත් සභා වලින් සහ මධ්‍යම රජයේ ආයතන වලින් අය කර ගැනීමට කටයුතු කරමි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| **(II) මුදල් රෙගුලාසි** | | | |
| මු.රෙ. 571 | 2022 දෙසැම්බර් 31 දිනට ආයතන 33 කට අදාළ වර්ෂ 2 ඉක්ම වූ නියාදනය නොකළ රු. 38,589,322 ක පොදු තැන්පත් ශේෂයක් විය. | 2022.12.31 දිනට පවත්නා වසර දෙකක් ඉක්මවූ මෙම ශේෂය රු. 38,589,322 කි. මින් වසර 2 ඉක්ම වුවද නෛතික අවශ්‍යතාවය මත පවත්වා ගෙන යා යුතු තැන්පත් මුදල් තබා ගැනීමටත්, ඉතිරි මුදල් නියාදනය කර ඉතිරි ශේෂයන් පළාත් සභා ආදායමට ගැනීමට ඉදිරි මාස කිහිපය තුළ කටයුතු සිදු කරමි. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ට අනුකූලව කටයුතු කළ යුතුය. |

**(ආ) ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට සමස්ථ ආදායම් වල මුළු ශුද්ධ හිඟ මුදල රු.159,955,481 ක් වූ අතර එම හිඟ මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | හිග මුදල් අය කර ගැනීම සඳහා අදාළ ආයතන මේ වන විටත් දැනුවත් කර ඇත.එම හිඟ මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.17 ශීර්ෂය 737 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය**

**අනුකූල නොවීම**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) ඌව පළාත් සභා මුදල් රීති සංග්‍රහය** | | | |
| රීති 104.2 , 104.3 හා 104.4 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) භාරයේ පැවති 2021 දෙසැම්බර් 10 දින හෝ ඊට ආසන්න දිනයකදී අස්ථානගතවී තිබුණු රු. 92,000 ක් වටිනා ලැප්ටොප් පරිගණක යන්ත්‍රය සම්බන්ධයෙන් 2023 ජනවාරි 16 දින වන විටත් ඉදිරිපත් කළ යුතු ප්‍රාරම්භක වාර්තාව ද, අලාභ හානිය සිදු වූ දින සිට තුන් මසක් ඇතුළත දී ඉදිරිපත් කළයුතු පූර්ණ වාර්තාව ද ඉදිරිපත් කර නොතිබුණි. | පූර්ණ වාර්තාව කඩිනමින් ලබාගැනීමට කටයුතු කරමි. | මුදල් රීති සංග්‍රහයේ යොමුගත රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| 2018 පෙබරවාරි 20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 හි 03(1) ඡේදය | රජයේ සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරියෙකු සේවා කඩවීමක් සහිතව හෝ රහිතව කලින් දැරූ තනතුරේම නැවත සේවයේ යොදවනු ලබන විටක ඔහු රාජ්‍ය සේවයේ අවසන් වරට ලැබූ වැටුපට සමාන මාසික දීමනාවක් ගෙවිය හැකි අතර 04 ඡේදය අනුව "අවසන් වරට ලද වැටුප" යන්න නිලධාරියා විශ්‍රාම යන අවස්ථාවේ ලබමින් සිටි වැටුප ලෙස සඳහන් වේ. එයට අවසන් වැටුප් වර්ධක දිනයේ සිට විශ්‍රාම යන දිනය දක්වා වන වැටුප් වර්ධකයේ උපයාගත් කොටස් ඇතුළත් නොවන බවද දක්වා ඇත. එමෙන්ම චක්‍රලේඛයේ 5 ඡේදය අනුව විශ්‍රාමික නිලධාරීන්ට ඔවුන් විශ්‍රාම ගන්නා අවස්ථාවේ ලද වැටුප පසු අවස්ථාවකදී සංශෝධනය වන්නේ නම් මිස චක්‍රලේඛයේ 12 ඡේදය අනුව කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවූ කිසිදු නිලධාරියෙකුගේ විශ්‍රාම වැටුප සංශෝධනය කිරීමේ හැකියාවක් නොමැත. එසේ වුවද ඌව පළාත් සභාවේ විශ්‍රාම ගොස් නැවත සේවයේ පිහිටුවන ලද නිලධාරීන් 14 දෙනෙකුට චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස රු. 3,728,598 ක වැටුප් ගෙවා තිබුණි. | මේ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් විමසීම් කර ඇති අතර අවසන් වශයෙන් විශ්‍රාමික නිලධාරින් නැවත සේවයේ යෙදවීමේදී ඒ අය සඳහා ගෙවන විශ්‍රාමික දිමනාව සම්බන්ධයෙන් උපදෙස් නිකුත් කර ඇත.ඊට අනුකූලවන ආකාරයෙන් අදාළ දීමනා ගෙවීම් කිරීම සිදු කර ඇති බව සඳහන් කරමි. එම ලිපියෙන්ද අනාවරණය නොවන යම් ගෙවීමක් වේ නම් අයකර ගැනීම සඳහා දැනුවත් කර ඇත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2018 අනුව ක්‍රියාකළ යුතු අතර චක්‍රලේඛයට පරිබාහිරව ගෙවා ඇති වැටුප් සහ දීමනා අයකරගත යුතුය. |

**1.5.18 ශීර්ෂය 738 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය**

**අනුකූල නොවීම්**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(I) ආයතන සංග්‍රහය** | | | |
| ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12.2.1 ඡේදය හා අංක 1589/30 හා 2009 පෙබරවාරි 20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍ර යේ ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 120 වන රීතිය | වැඩබැලීමට නිලධාරියෙකු පත්කිරීමේදී වැඩබැලීමේ පත්වීමක් ලබන නිලධාරියා දරන නිත්‍ය තනතුරට සම තත්ත්වයේ තනතුරකට හෝ ඉහළ තත්ත්වයේ තනතුරකට පත්කළ යුතුය. යම් නිලධාරියෙකුගේ නිත්‍ය තනතුරට වඩා පහළ තනතුරක වැඩබැලීමකදී වැඩබැලීමේ දීමනාවක් ගෙවීමට නොහැකි වුවත්, ඊට අනුකූල නොවන පරිදි තමා දරන නිත්‍ය තනතුරට වඩා පහල තනතුරුවල වැඩබැලීමට පත්කළ නිලධාරීන් 08 දෙනෙකු වෙනුවෙන් වසර 01 සිට 05 දක්වා කාලය තුළ වැඩබැලීමේ දීමනා ලෙස රු. 2,434,935 ක් ගෙවා තිබුණි. | නිත්‍ය තනතුරුවල පවත්නා පුරප්පාඩුවලට අදාළව දැනට පවත්නා නෛතික තත්ත්වයන්ට අනුව පත්කිරීම සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවකදී ඉහළ තනතුරුවල නිලධාරීන්ද අදාළ තනතුරුවල වැඩබැලීම් සඳහා හා වැඩ බැලීමට පත්කිරීමට නොහැකි අවස්ථාවලදී රාජකාරි ඉටුකිරීම් වෙනුවෙන් ආණ්ඩුකාරතුමාගේ විධිමත් පත්වීමක් මත එම සේවයේ යොදවා ඇති බව සඳහන් කරමි. විශේෂයෙන් දීප ව්‍යාප්ත සේවාවන් වලට අදාළව සිටිය යුතු නිලධාරීන් සංඛ්‍යාවෙන් අඩක් පමණක් මෙම පළාත තුළ සේවයේ යෙදී ඇති හෙයින් මෙවැනි තීරණයන් ගැනීමට හේතු වී ඇත. | ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12.2.1 වගන්තිය හා අංක 1589/30 හා 2009 පෙබරවාරි 20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 120 වන රීතියේ සඳහන් විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| **(II) අයවැය චක්‍රලේඛ** | | | |
| 2014 ජනවාරි 01 දිනැති අංක 01/2014 දරන චක්‍රලේඛයේ 2.1.3(II) ඡේදය | රජයේ නිලධාරීන් සඳහා ඉන්ධන දීමනාව ගෙවීමේදී අදාළ මාසයේ පළමු දින ලංකා ඛණිජ තෙල් | නිල වාහන හිමි නිලධාරීන් සඳහා ඉන්ධන දීමනා ගෙවීම සම්බන්ධයෙන් නිශ්චිත ඉන්ධන ලීටර ප්‍රමාණයක් සඳහන් කර | 2014 ජනවාරි 01 දිනැති අංක 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ |

| | | |
|---|---|---|
| නීතිගත සංස්ථාව විසින් ප්‍රකාශිතව පැවැති සාමාන්‍ය පෙට්‍රල් හා ඩීසල් මිල ගණන් මත පදනම්ව ගණනය කළයුතුව තිබුණි. එකී උපදෙස් සැලකිල්ලට නොගෙන නිලවාහන හිමිකම් ලබන නිලධාරීන් 72 දෙනෙකුට මාසයේ පළමු දිනට පවතින ඉන්ධන ලීටරයක මිල ලෙස සුපිරි පෙට්‍රල්වල සහ ඩීසල්වල මිල පදනම් කරගෙන මාසික ඉන්ධන දීමනාව ගණනය කර 2009 ජනවාරි මස සිට 2022 ජුලි මාසය දක්වා කාලය තුළ රු. 7,842,436 ක් වැඩිපුර ඉන්ධන දීමනා ගෙවා තිබුණි. | ඇතත් නිශ්චිත ඉන්ධන වර්ගයක් සඳහන් කර නොමැත. ඒ අනුව, විශේෂයෙන් රජයේ නව වාහන වෙනුවෙන් තාක්ෂණික නිර්දේශ අනුව විශේෂිත ඉන්ධන වර්ගයක් නියම කර ඇති අවස්ථාවලදී වාහන සඳහා එම ඉන්ධන වර්ගය භාවිතා කිරීම සිදු කරයි. කෙසේ වෙතත්, පසුගිය කාලය තුළදී ඉන්ධන මිල ඉහළ යාම හා ඉන්ධන හිඟය හා ඒ අනුව ඉන්ධන වර්ගයන් වෙළඳපොළ තුළ නොමැති වීම, ප්‍රතිපාදන සීමා වීම සැලකිල්ලට ගෙන 2022 ජුනි මස සිට සාමාන්‍ය ඉන්ධන වෙනුවෙන් ගෙවීම තීරණය කර ඇත. | 2.1.3(ii) ඡේදය ප්‍රකාරව වැඩිපුර ගෙවූ මුදල් ආපසු අයකර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### (අ) මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු. 3,328,737,257ක ඌනතාවයක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,205,982,794 ක් විය. ඒ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,122,754,463 කින් පිරිහී තිබුණි.

**(ආ)** **ආදායම් හා වියදම් විචලනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ආදායම හා වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

**ආදායම**

| | **2022** | **2021** | **විචලනය** |
|---|---|---|---|
| | **තථ්‍ය** | **තථ්‍ය** | |
| | **රු.** | **රු.** | **රු.** |
| **පළාත් සභා විෂයයන්ට අදාළ ආදායම්** | | | |
| බදු ආදායම | 1,583,187,067 | 1,513,326,027 | 69,861,040 |
| බදු නොවන ආදායම | 670,373,795 | 612,779,708 | 57,594,087 |
| රජයේ ප්‍රදාන | 28,518,761,554 | 28,343,106,749 | 175,654,805 |
| එකතුව | 30,772,322,416 | 30,469,212,484 | 303,109,932 |

**වියදම**

| | **2022** | **2021** | **විචලනය** |
|---|---|---|---|
| | **තථ්‍ය** | **තථ්‍ය** | |
| | **රු.** | **රු.** | **රු.** |
| **පුනරාවර්තන වියදම්** | | | |
| පෞද්ගලික පඩිනඩි | 23,781,726,765 | 21,985,850,940 | 1,795,875,825 |
| අනෙකුත් පුනරාවර්තන | 9,601,454,352 | 9,362,993,485 | 238,460,867 |
| උප එකතුව | 33,383,181,117 | 31,348,844,425 | 2,034,336,692 |
| පුනරාවර්තන ස්වභාවයේ සංවර්ධන වියදම | 717,878,555 | 1,326,350,852 | (608,472,297) |
| එකතුව | 34,101,059,672 | 32,675,195,277 | 1,425,864,395 |
| අතිරික්තය/(ඌනතාවය) | (3,328,737,256) | (2,205,982,793) | (1,122,754,463) |

| | |
|---|---|
| - පුනරාවර්තන ස්වභාවයේ සංවර්ධන වියදම | 717,878,555 |
| - ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කරනු ලබන ප්‍රාග්ධනිත කරනු ලබන වියදම්. | 1,160,358,120 |
| | ------------------ |
| රාජ්‍ය ආයෝජන | 1,878,236,675 |
| | ========== |

සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු. 30,772,322,416 ක් වූ අතර ඉන් රු. 28,518,761,554ක් රජයේ ප්‍රදාන විය. බදු ආදායම රු. 1,583,187,067 ක් එනම් මුළු ආදායමෙන් සියයට 5 ක් ද බදු නොවන ආදායම රු.670,373,795 ක් එනම් මුළු ආදායමෙන් සියයට 2 ක්ද වී තිබුණි. වර්ෂයේ මුළු ආදායම වූ රු. 30,772,322,416 න් පුනරාවර්තන වියදම් සඳහා (ක්ෂය හැර) රු. 28,729,939,180 ක් එනම් සියයට 94 ක්ද රජයේ ආයෝජන සඳහා රු. 1,878,236,675 ක් එනම් සියයට 06 ක් ද උපයෝජනය කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

### (අ) රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබුණු ප්‍රතිපාදන සහ ඒවා උපයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | මූලාශ්‍රය | අනුමත මුදල | වැය කළ මුදල | ඌන උපයෝජනය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (අ) | උපමාන පාදක ප්‍රදාන | 165,000,000 | 92,400,000 | 72,600,000 |
| (ආ) | පළාත් විෂය නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 1,698,000,000 | 908,000,000 | 790,000,000 |
| (ඇ) | ලෝක බැංකු ආධාර | | | |
| | - විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන(අධ්‍යාපන) | 330,000,000 | 300,000,000 | 30,000,000 |
| | - විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (සෞඛ්‍ය) | 560,000,000 | 560,000,000 | - |
| | | ----------------- | ----------------- | --------------- |
| | එකතුව | 2,753,000,000 | 1,860,400,000 | 892,600,000 |
| | | ========== | ========== | ========= |

**(ආ) පළාත් සංවර්ධන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අඛණ්ඩ වැඩ වෙනුවෙන් රු. මිලියන 2950 ක ඇස්තමේන්තු වටිනාකමකට වූ ව්‍යාපෘති යෝජනා 1035 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව ව්‍යාපෘති වැඩ යෝජනාවල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| | **ව්‍යාපෘති විස්තර** | **නව වැඩ යෝජනා ගණන** | **අඛණ්ඩ වැඩ යෝජනා ගණන** | **මුළු වැඩ යෝජනා ගණන** | **මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම රු.** |
|---|---|---|---|---|---|
| (අ) | සම්පූර්ණයෙන් නිමකළ | 438 | 427 | 865 | |
| (ආ) | 50% ට වඩා වැඩියෙන් නිමකළ | 63 | 40 | 103 | |
| (ඇ) | 50% ට වඩා අඩුවෙන් නිමකළ | 27 | 18 | 45 | 2,949,855,177 |
| (ඈ) | ආරම්භකර නොතිබූ | 21 | 1 | 22 | |
| (ඉ) | මතභේදකාරී/ප්‍රශ්නකාරී තත්ත්වයන් යටතේ වූ | - | - | - | |
| | එකතුව | 549 | 486 | 1035 | |